# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,182 — 1960 අගෝස්තු 12 වැනි සිකුරාදා — 12.8.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි, සෑම කොටසකටම අයක් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | 161 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ... | — |
| තනතුරු—ඇබෑර්තු ... ... | — | අය-වැය ලේඛන ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — | දේපල විකිණීම ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | 163 | මාර්ග කොමිටි දැන්වීම් ... ... | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් | — | විවිධ දැන්වීම් ... ... | 163 |


## පළාත් පාලන නිවේදන

### ගඟබොඩ පත්තු ගම්කාර්ය සභාව

කළුතර දිස්ත්‍රික්කයේ ගඟබොඩ පත්තු ගම්ප්‍රදේශයේ ගම්කාර්ය සභාව විසින් සම්මත කරන ලද පහත සඳහන් යෝජනා මහජනයාගේ දැනගැනීම පිණිස මෙයින් පළ කරනු ලැබේ.—

ගම්කාර්ය සභා කාර්යාලය,
වෙල්ගම-බුලත්සිංහල,
1 මැයි, 1960.

ඩී. ඒ. කන්නන්ගර,
ප්‍රධාන තැන.

#### යෝජනාව

1952 අංක 6 දරණ ප්‍රදේශාධිකාරි සභා පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා ආඥාපනතේ 3 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ ගඟබොඩ පත්තු ගම්ප්‍රදේශයේ ගම්කාර්ය සභාව විසින් 1955ක්වූ ජූනි මස 17 වැනි දින අංක 10,809 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද යෝජනාවෙන් සම්මත කරගන්නා ලද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 4 වැනි කාණ්ඩයේ 1 වැනි අතුරු ව්‍යවස්ථාව ප්‍රකාර මෙහි පහත මංමාවත් එකිනෙක ඉදිරියේ සඳහන් දිග හා පළල අනුව සෑදීමට, නැවත සෑදීමට සහ නඩත්තු කිරීමට මෙයින් යෝජනා කරනු ලැබේ.

| උපදේශක කොට්ඨාශයේ නම සහ අංකය | පාරේ අංකය | පාරේ නම | දිග හැ. | දිග ද. | පළල අඩි |
|---|---|---|---|---|---|
| 1. මහගම උතුර | 1 | දෙමෝදරවත්ත ඉම්මිල්ල කුඩලිගම පාර | 1 | 46 | 15 |
| | 2 | දෙල්පවත්ත දීයකඩුව පාර | 1 | 41 | 15 |
| 2. මහගම දකුණ | 3 | වලහැඩිමුල්ල කුරුදුවත්ත පාර | — | 42 | 15 |
| | 4 | පොලේගොඩ ඕමත්ත පාර | 1 | 45 | 15 |
| | 5 | පොලේගොඩ වේයන්ගල්ල පාර | — | 75 | 15 |
| | 6 | පොලේගොඩ සුදර්ශනාරාම පාර | 1 | 10 | 15 |
| | 7 | වලහැඩි මුල්ල පොලේගොඩ පාර | — | 25 | 15 |
| | 8 | ගමගෙවත්ත ඕමත්ත පාර | 1 | 35 | 15 |
| | 9 | කුරුදුවත්ත මං හන්දිය පාර | — | 26 | 15 |
| | 10 | පොලේගොඩ කුඩලිගම පාර | — | 78 | 15 |

161—ජේ. ඇන්. බී 25620—3,713 (8/60)

| උපදේශක කොට්ඨාශයේ නම සහ අංකය | පාරේ අංකය | පාරේ නම | දිග, හැ. | දිග, දා. | පළල අඩි |
|---|---|---|---|---|---|
| 3. වෙල්ගම | 11 | අකුර සොහොන්බිම් පාර | — | 42 | 15 |
| | 12 | කල්එමලේ ඉහලවෙල්ගම පාර | 1 | 35 | 15 |
| | 13 | ඉහලවෙල්ගම පොලේගොඩ පාර | 1 | 94 | 15 |
| | 14 | වල්විවත්ත දම්පරාදුගොඩ තොටුපලපාර | — | 27 | 15 |
| 4. බුලත්සිංහල | 15 | හොරගල් හන්දිය තිබ්බොට්ටාව පාර | 1 | 74 | 15 |
| | 16 | පහල ඇගල්ඔය රාජාලිමානාන පාර | 1 | 17 | 15 |
| | 17 | ඇගල්ඔය අමරගෙදර පාර | — | 49 | 15 |
| | 18 | මාමිනිය ගොඩැල්ල තිබ්බොට්ටාව පාර | — | 28 | 15 |
| | 19 | බාලිකා පාසැල පාර | — | 20 | 15 |
| | 20 | ආරච්චිගොඩ ගම්මැදි පිටිය පාර | — | 73 | 15 |
| | 21 | ගම්මැදි පිටිය ගුලන ඇලපාර | — | 38 | 15 |
| 5. යටගම්පිටිය | 22 | ගල්කැටිය යටගම්පිටිය නිග්ගහ පාර | 2 | 25 | 15 |
| | 23 | කොපිල්ලගොඩ පාර | — | 61 | 15 |
| | 24 | නාගහදෙල පාර | — | 66 | 15 |
| 6. මෝල්කාව | 25 | පරගොඩ පන්සල පාර | — | 27 | 15 |
| | 26 | පරගොඩ රතඹලකොත පාර | — | 40 | 15 |
| | 27 | මෝල්කාව මානාන පාර | 1 | 07 | 15 |
| | 28 | පරගොඩ කිතුල්ගල්විල පාර | 1 | 06 | 15 |
| | 29 | පරගොඩ අලවිය වත්ත පාර | — | 60 | 15 |
| 7. බෝතලේගම | 30 | යහලවත්ත බෝතලේපාර | 2 | 02 | 15 |
| | 31 | ඇගල්ඔය දිවලකඩ පාර | 1 | 66 | 15 |
| | 32 | බෝතලේ කළුගල පාර | 1 | 20 | 15 |
| | 33 | යහලවත්ත ඕපල්ල පාර | 1 | 60 | 15 |
| | 34 | ඇගල්ඔය කළුගල පාර | — | 68 | 15 |
| | 35 | කළුගල පන්සල රටඇලදොල පාර | 1 | 25 | 15 |
| 8. හල්වතුර | 36 | හල්වතුර පාසැල පාර | — | 16 | 15 |
| | 37 | හල්වතුර තොටුපල දෙල්මැල්ල පාර | 3 | 40 | 15 |
| 9. දෙල්මැල්ල | 38 | හල්වතුර දෙල්මැල්ල පාර | 1 | 50 | 15 |
| | 39 | දෙල්මැල්ල උඩුකල් කන්ද පාර | 2 | 00 | 15 |
| 10. ගෝවින්න | 40 | දියබොරැල්ල ශිලවංසාරාම පාර | 1 | 61 | 15 |
| | 41 | ගෝවින්න කිරිමැටිවලකඩ පාර | 1 | 45 | 15 |
| | 42 | දේවමුල්ල දියගන්කොට පාර | 1 | 20 | 15 |
| | 43 | දේවමුල්ල දෙමෝදර පාර | 1 | 00 | 15 |
| | 44 | රැටියල වෙරගං ඇල පාර | 2 | 00 | 15 |
| | 45 | පැල්පොල වත්ත මවරළුගස් තොටුපල පාර | — | 60 | 15 |
| 11. දේවමුල්ල | 46 | දියබොරැල්ල වෙහෙරවත්ත පාර | 2 | 48 | 15 |
| | 47 | දේවමුල්ල කොක්හේන පාර | — | 61 | 15 |
| | 48 | දේවමුල්ල අම්ගොඩ පාර | — | 60 | 15 |
| | 49 | දේවමුල්ල කුරුදුවත්ත දියගන්කොට පාර | 1 | 75 | 15 |
| | 50 | දේවමුල්ල නාරගල පාර | 1 | 02 | 15 |
| 12. කොබොවක | 51 | ගෝවින්න ඉලිඹ පාර | 2 | 12 | 15 |
| | 52 | අම්බලම ඕපල්ල පාර | 1 | 12 | 15 |
| | 53 | කොබොවක කිරිමැටිවලකඩ පාර | 1 | 23 | 15 |
| | 54 | කොබොවක ඕපල්ල පාර | 1 | 27 | 15 |
| | 55 | කොබොවක කළුගල පාර | — | 49 | 15 |
| | 56 | ඉහලනාරගල කොබොවක බෝධිය පාර | 1 | 60 | 15 |
| 13. කුඩලිගම | 57 | කුඩලිගම නාහල්ල පාර | — | 23 | 15 |
| | 58 | කුඩලිගම සොහොන් බිම පාර | — | 12 | 15 |
| | 59 | කුඩලිගම ඉද්දගොඩ පාර | 1 | 04 | 15 |
| 14. වේයන්ගල්ල | 60 | වේයන්ගල්ල පොලේගොඩ පාර | — | 24 | 15 |
| | 61 | වේයන්ගල්ල හිඹුරු අරඹ පාර | 1 | 10 | 15 |
| | 62 | වේයන්ගල්ල පල්ලිය වත්ත පාර | — | 30 | 15 |
| 15. නාහල්ල | 63 | නාහල්ල වරකගොඩ පන්සල පාර | — | 49 | 15 |
| | 64 | නාහල්ල කුඩලිගම පාර | — | 61 | 15 |
| | 65 | නාහල්ල සද්දම්ගොඩ පාර | — | 57 | 15 |
| 16. දියකඩුව | 66 | දීකඩුව වැලිපත හේන පාර | — | 43 | 15 |
| | 67 | දියකඩුව මහගම පාර | — | 56 | 15 |
| | 68 | වැලිපතහේන තැන්නහේන පාර | — | 24 | 15 |
| 17. කරන්නගොඩ | 69 | කරන්නගොඩ දෙමෝදර පාර | — | 50 | 15 |
| | 70 | ඉහලකරන්නාගොඩ පන්සල පාර | — | 09 | 15 |
| | 71 | කරන්නාගොඩ සොහොන් බිම පාර | — | 20 | 15 |
| 18. වරකගොඩ | 72 | වරකගොඩ කුඩලිගම පාර | — | 28 | 15 |
| | 73 | වරකගොඩ වෙහෙරගොඩ පාර | — | 30 | 15 |
| | 74 | වරකගොඩ කෝට්ටයාහේන පැලපිටියගොඩ පාර | — | 65 | 15 |
| | 75 | වරකගොඩ කුරුදුවත්ත පාර | 1 | 00 | 15 |

# අතුරු ව්‍යවස්ථා

ඇල්.ඩී.—බී. 126/48

ඇල්.ජී.ඩී.—ජී.එච් 11/8සී

## ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදය) 49 වැනි වගන්තිය යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර මැදපළාත ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය-සභාව විසින් සම්පාදිතව, 1947ක්වූ සැප්තැම්බර් මස 24 වෙනි දින අංක. 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිත වූ එකී වගන්තියෙන් පළාත් පාලන සහ නිවාස පිළිබඳ ඇමතිතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරනලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ නිවාස පිළිබඳ අමාත්‍යාංශයේ
සථිර ලේකම් තැන.

වර්‍ෂ 1960 ක්වූ ජූලි මස 29 වෙනි දින,
කොළඹදීය.

### අතුරු ව්‍යවස්ථා

### අන්තරාදායකවූ අප්‍රසන්නවූ කර්මාන්ත

1. පහත දක්වෙන කර්මාන්ත අප්‍රසන්නවූ කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ:—

(ඒ) ජාඩි හෝ කරවල ගබඩා කිරීම.
(බී) තොගගණනේ විකිණීම සඳහා නරක්විය හැකි ආහාර ද්‍රව්‍ය හා සිල්ලර බඩු ගබඩා කිරීම.
(සී) කොම්පෝස්ට් නොහොත් කෘතිම පොහොර සෑදීම.
(ඩී) විනාකිරි සෑදීම.
(ඊ) සබන් සෑදීම.
(ඇෆ්) දුම්කොළ වියලීම හෝ සකස් කිරීම.
(ජී) හම් පදම් කරන ස්ථානයක් තබා ගැණීම.
(එච්) පුවක් වියලීම, සකස් කිරීම.
(අයි) සතුන්ගේ ලේ හෝ මලකුණු හෝ උනු කිරීම.
(ජේ) සතුන්ගේ හම් හෝ ඇටකටු හෝ ගබඩා කිරීම.
(කේ) රබර් ෂීට් හෝ ක්‍රේප් රබර් දුම් ගැස්සවීම හෝ සෑදීම.
(ඇල්) කෘතිම පොහොර හෝ කෘතිම පොහොර සෑදීම ගන්නා ද්‍රව්‍ය හෝ ගෝනි තුනකට වඩා ගබඩා කිරීම.
(ඇම්) සෝඩා සෑදීම.
(ඇන්) ලැලි පොහවා සකස් කිරීම.
(ඕ) මාළු අයිස් දැමීම.
(පී) සුරුට්ටු, සිගරට් හෝ බීඩි සෑදීම.
(කිව්) රා එකතු කරන ස්ථානයක් තබා ගැණීම.
(ආර්) පැණි හෝ හකුරු සෑදීම.
(ඇස්) රබර් වියලීම හෝ සෑදීම.

2. පහත සඳහන් කර්මාන්ත අන්තරාදායක කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ:—

(ඒ) තේකර්මාන්ත ශාලාවක් තබාගැනීම.
(බී) කොප්පරා සෑදීම හෝ ගබඩා කිරීම.
(සී) තෙල් වර්‍ග වලින් හෝ වාෂ්ප බලයෙන් හෝ පැට්‍රල් ආදී දැවෙන ද්‍රව්‍ය වලින් හෝ ඉලැක්ට්‍රික් බලයෙන් හෝ ක්‍රියා කරන යන්ත්‍ර පාවිච්චි කරන යම් කර්මාන්තයක්.
(ඩී) කබෝක් ගල්, බොරළු, කළුගල් ලබාගැනීමට වළවල් කැනීම.
(ඊ) මිණිරන් වියලීම හෝ ගබඩා කිරීම.
(ඇෆ්) වළක් කැණීමෙන් හුනුගල් ලබා ගැනීම.
(ජී) හාල් හෝ වී මෝලක් තබාගැනීම.
(එච්) යන්ත්‍ර සූත්‍රාදියෙන් පොල්තෙල් සෑදීම.
(අයි) සෙක්කුවෙන් පොල්තෙල් සෑදීම.
(ජේ) දර හෝ ලී මඩුවක් තබා ගැනීම.
(කේ) කෙඳි වර්‍ග තෙලීම හෝ ගබඩා කිරීම.
(ඇල්) කපු පුළුන් නූල් හෝ පිදුරු ගබඩා කිරීම.
(ඇම්) භූමිතෙල් ගබඩාවක් තබා ගැණීම.
(ඇන්) මුද්‍රණාලයක් තබාගැණීම.
(ඕ) කපාපු පොල් සකස් කිරීම.
(පී) ස්වර්ණාභරන සෑදීම.
(කිව්) ලෝකුරු වැඩ සඳහා වැඩ පොළක් තබා ගැනීම.
(ආර්) අම්ලකර වායුව යොදා කම්මල් වැඩ කරන ඕනෑම කර්මාන්තයක්.
(ඇස්) පැඟිරි තෙල් හෝ කුරුඳු තෙල් සෑදීම.
(ටී) කොප්පරා ගබඩා කිරීම.
(යූ) පොල්කටු අඟරු ගබඩා කිරීම.
(වී) පිදුරු ගබඩා කිරීම.
(ඩබ්ලිව්) කම්හල් කර්මාන්තය පවත්වාගෙනයාම.
(ඇක්ස්) වඩු කර්මාන්තයක් පවත්වාගෙනයාම.
(වයි) බයිසිකල් අළුත්වැඩියා කිරීම සඳහා වූ ස්ථානයක් තබා ගැනීම.

3. පහත සඳහන් කර්මාන්ත අප්‍රසන්න හා අනතුරුදායක කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ:—

(ඒ) කෙඳි වර්‍ග සායම් කිරීම.
(බී) ගඩොල් හෝ උළු පිච්චීම.
(සී) බැටරි චාජ් කිරීම.
(ඩී) හුණුගල් පිච්චීම, ගබඩා කිරීම, සකස් කිරීම හෝ කැබලි කිරීම.
(ඊ) අඟුරු හා පොල් කටු අඟුරු පිළිස්සීම.

4. කාර්‍ය සභාව විසින් සම්පාදිතව වර්‍ෂ 1955 මාර්තු මස 4 වෙනි දින අංක 10,771 දරන ගැසට් පත්‍රයේ පළකරනලද අන්තරාදායක වූ හා අප්‍රසන්න වූ කර්මාන්ත පිළිබඳ අතුරු ව්‍යවස්ථා මෙයින් අවලංගුකරනු ලැබේ.

---

# විවිධ දැන්වීම්

## අම්බලන්ගොඩ නගරසභාව

අම්බලන්ගොඩ නගරසභා සීමාව තුළ පිස්සු බලු රෝග භීතියක් පවතින හෙයින් පිස්සු බලු රෝග ආඥාපණතේ 11 වෙනි ඡේදය යටතේ මෙයින් දැනුම් දෙනුයේ පෞද්ගලික මිදුලක හෝ ගෙවත්තක නොව මෙම නගරසභා සීමාව තුළ පිහිටි ඕනෑම ප්‍රසිද්ධ ස්ථානයක හෝ පාරක හෝ සිටින නොබඳිනා ලද දක්කාගෙන නොයන ලද හෝ ඕනෑම බල්ලෙකු හෝ බැල්ලියක හෝ මා විසින් ලියවිල්ලෙන් බලය පවරණ ලද කෙනෙකු විසින් එවේලෙහිම විනාශ කිරීමට භාජනය වන බවයි.

මේ ප්‍රකාශනය කලින් අවලන්ගු කරන්ට නොයෙදුනොත් 1960වේ දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා වලන්ගුවේ.

පී. ඩබ්ලිව්. විල්fප්‍රඩ් ද සිල්වා,
අම්බලන්ගොඩ නගරසභාවේ සභාපති.

1960 අගෝස්තු මස 4 වෙනි දින,
අම්බලන්ගොඩ නගරසභා කාර්යාලයේදීය.

## මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම 1960 වර්ෂයට ඉල්ලා සිටින බවත්, මෙම බලපත්‍රය නිකුත් කිරීමට විරුද්ධව පොළොන්නරු දිස්ත්‍රික්කයේ සිංහල පත්තු ගම්කායයී සභා ප්‍රදේශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට, තමා ඒ සඳහා විරුඬ වන්නේ අසවල් කරුණ නිසායයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටිනසේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවන දින සිට 14 දිනක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත යටතේ 201 වැනි පරිච්ඡේදයේ අංක 7 දරන 1947 තේ අංක 44 දරන ආඥාපනතින් සංශෝධිතවූ අංක 6 දරණ ආඥාපනත යටතේ මෙයින් දැනුම් දෙමි.

එච්. ඇම්. විලියම් බණ්ඩාර,
සිංහලපත්තු ගම්කායයී සභාවේ
ප්‍රධානතැන.

ගම්සභා කායයීලය,
මින්නේරිය.
8.8.1960.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | ස්ථානය | වෙළඳම |
|---|---|---|
| 1. පී. ඕ. ඇම්. අබ්දුල් මජීඩ. | හිඟුරක්ගොඩ | හරක්මස් |

---

## උඩුබද්දාව ගම්කාර්ය සභාව—කුරුණෑගල දිස්ත්‍රික්කය

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණත, "201 වෙනි පරිච්ඡේදය"

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම සඳහා 1960 වර්ෂයට බලපත්‍රයක් ඉල්ලුම්කර තිබෙන බවත්, මෙම බලපත්‍රය නිකුත් කිරීමට විරුද්ධව උඩුබද්දාව ගම්කායයී සභා ප්‍රදේශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණු සඳහා යයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටිනසේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවන දින සිට දින 14 ක් ඇතුළත් මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වෙනි පරිච්ඡේදයේ අංක 7 දරන ආඥාපනතින් සංශෝධිත වූ අංක 6 දරන ආඥාපනත යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

කේ. ආරියවංශ ඇස්. පෙරේරා,
සභාපති.

ගම්කාර්ය සභා කාර්යාලය,
උඩුබද්දාව, 1960 අගෝස්තු 2 වෙනි දින දීය.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| ඩබ්ලිව්. ඇස්. බෙනඩික් ප්‍රනාන්දු. | මිදෙල්ල | හරක් මස් |

---

## කොළඹ දිස්ත්‍රික්කයේ හංවැල්ල පේරුව ගම්කායයී සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි නම් සඳහන් අයවලුන් විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1961 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධව කොළඹ දිස්ත්‍රික්කයේ හංවැල්ල පේරුව ගම්කාර්ය සභා ප්‍රදේශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණ නිසායයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටින සේ මෙම දැක්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට 14 දිනක් ඇතුළත මාවෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වෙනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥාපනතින් සංශෝධිත වූ අංකී 6 දරන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දොන් සුගතන් එදිරිසිංහ,
හංවැල්ල පේරුව ගම්කායයී සභාවේ සභාපති.

ගම්කාර්ය සභා කාර්යාලය,
හංවැල්ල, 1960. 8. 4.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය |
|---|---|
| ඇම්. ඩී. තෝමස් අප්පුහාමි, මිදෙල්ලවිට, ගනේමුල්ල. | හංවැල්ල ප්‍රසිද්ධ මාර්කට් ස්ථානයේ අංක 1 සහ 3 දරන කඩපිල්. |
| ඇම්. ඩී. තෝමස් අප්පුහාමි, මිදෙල්ලවිට, ගනේමුල්ල. | හංවැල්ල ප්‍රසිද්ධ මාර්කට් ස්ථානයේ අංක 2 දරන කඩපිල. |
| ඇම්. ඩී. තෝමස් අප්පුහාමි, මිදෙල්ලවිට, ගනේමුල්ල. | මීගොඩ ප්‍රසිද්ධ මාර්කට් ස්ථානයේ කඩ කාමරය. |
| ඇම්. ඩී. තෝමස් අප්පුහාමි, මිදෙල්ලවිට, ගනේමුල්ල. | ඇඹුල්ගම මංසන්ධියේ පිහිටි කඩකාමරය. |
| ඇම්. ඩී. තෝමස් අප්පුහාමි, මිදෙල්ලවිට, ගනේමුල්ල. | හංවැල්ල ප්‍රසිද්ධ මාර්කට් ස්ථානයේ අංක 4 දරන කඩපිල. |

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.